Australian Government

COVID-19 VACCINATION

# කෝවිඩ්-19 Comirnaty (Pfizer) එන්නත සම්බන්ධ තොරතුරු

අවසාන යාවත්කාලීන කිරීම: 2021 සැප්තැම්බර් 15

## එන්නත සම්බන්ධව

**ෆයිසර්** යනු මිනිසුන් කෝවිඩ්-19 ආසාදනයවීමෙන් වළක්වා ගත හැකි එන්නතකි. එන්නතින් මාත්‍රා දෙකක් ලබා ගැනීම වැදගත්වේ. මෙම මාත්‍රා සාමාන්‍යයෙන් සති 3 - 6 අතර කාල පරතරයක් ඇතිව ලබා දුන්නද, විශේෂ අවස්ථානුගත තත්වයන් යටතේ වඩා වැඩි කාල අන්තර නිර්දේශ කල හැකිය. COVID-19 Pfizer හි කිසිදු ජීවී වයිරසයක් අඩංගු නොවන අතර ඔබට කෝවිඩ්-19 ආසාදනය ඇතිකල නොහැක. එහි අඩංගු වන්නේ SARS-CoV-2 වයිරසයේ වැදගත් කොටසක් වන ස්පයික් ප්‍රෝටීන් (spike protein) ලෙස හඳුන්වන ජාන කේතයවේ. එන්නත ලබා ගැනීමෙන් පසුව, ඔබගේ ශරීරය මගින් ස්පයික් ප්‍රෝටීනයේ පිටපත් සකස් කරයි. ඉන්පසුව, ඔබගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය SARS-CoV-2 වයිරසය හඳුනාගෙන කෝවිඩ්-19 ආසාදනයට විරුද්ධව සටන් කරන ආකාරය ඉගෙන ගනී. ඉන්පසුව, ශරීරය මගින් ජාන කේතය වේගයෙන් බිඳ දමයි.

එන්නත ලබා ගැනීම ස්වේච්ඡාවෙන්වේ සහ නොමිළේ ලබාදේ. ඔබට ඇති ගැටළු හෝ කනස්සළු, එන්නත ලබා ගැනීමට පෙර ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා හෝ සාමාන්‍ය වෛද්‍යවරයාගෙන් ලබා ගත හැකිය.

## එන්නතෙහි ප්‍රතිලාභ

අති විශාල විකිත්සක අත්හදා බැලීමක් මගින් පෙන්වා දුන්නේ වයස අවුරුදු 12 සහ ඊට වැඩි අය සම්බන්ධයෙන් කෝවිඩ්-19 වැළැක්වීම සඳහා Pfizer ඵලදායී බවයි. එන්නත ලබා නොගත් අයට වඩා Pfizer මාත්‍රා දෙකක් ලබාගත් අයගෙන් සියයට 95 ක් හට රෝග ලක්ෂණ සහිතව කෝවිඩ්-19 ආසාදනය ඇතිවීමේ හැකියාව අඩුය. එය වයස අවුරුදු 65 ට වඩා වැඩි අය තුල මෙන්ම ස්ථාවරයවූ කලින් රෝග තත්වයන් තිබුණු අය තුලද සඵලව ක්‍රියා කරයි.

කෝවිඩ්-19 ට එරෙහි ආරක්ෂාව ආරම්භ වන්නේ පළමුවන මත්‍රාව ලබා සති 2-3 කට පමණ පසුවය. එක් මාත්‍රාවක් මගින් තරමක් ආරක්ෂාව ලබා දුන්නද එය පවතින්නේ කෙටි කාලයක් සඳහා පමණි. මාත්‍රා දෙකක් මගින් ප්‍රශස්ථ ආරක්ෂාව ලබාදේ. කිසිම එන්නතක් සියයට සීයක් සපල නොවන අතර ඔබට එන්නතට පසුව වුවද කෝවිඩ්-19 ආසාදනය වීමේ හැකියාව ඇත.

මෙයින් අදහස් වන්නේ SARS-CoV-2 මගින් තවදුරටත් එන්නත් ලබාදුන් අයෙකු ආසාදනය විය හැකි බවයි. ඔවුනට රෝග ලක්ෂණ හෝ සුළු රෝග ලක්ෂණ නොතිබුණද ඔවුන් විසින් වයිරසය වෙනත් අයෙකුට ආසාදනය කල හැකිය. කෙසේවුවද, දැනට ඕස්ට්‍රේලියාවේ භාවිතා කරන කෝවිඩ්-19 එන්නත මගින් එන්නත ලබා ගත් අයෙකුට ආසාදනය ඇතිවූ අවස්ථාවල, ඔහු මගින් වෙනත් සමීප සම්බන්ධවුණු අය හට ආසාදනය ඇතිවීමේ ඉඩකඩ අඩු කිරීම සම්බන්ධයෙන් කාර්‍යක්ෂම ආකාරයට කටයුතු කරයි.

මේ හේතුව නිසයි එන්නත ලබා ගත් පසුවපහත ඇති පූර්වාරක්ෂක ක්‍රියා මාර්ග තව දුරටත් ගැනීම වැදගත් වන්නේ:

- ශාරීරික දුරස්ථභාවය
- අත් සේදීම
- මුහුණු ආවරණ පැළඳීම
- ඔබගේ ප්‍රාන්තය/ටෙරිටරිය මගින් අවශ්‍ය වන පරිදි කෝවිඩ්-19 පරීක්ෂා/හුදෙකලාවීම.

ඔබව Pfizer මාත්‍රා දෙකක් මගින් එන්නත ලබාදී ඇතිනම්, ඔබගේ පළාත් සෞඛ්‍යය අධිකාරීන් මගින් නියම කරන ආකාරයට ඔබ පරීක්ෂණ කර ගැනීමේ අවශ්‍යතා සපුරාලන්නේ නම් (උදා. උණ, කැස්ස, උගුරේ ආසාදන), ඔබ විසින් කෝවිඩ්-19 පරීක්ෂණයක් කර ගත යුතුය.

## මෙම එන්නත ලබා ගත හැක්කේ කවුරුන් හටද

වයස අවුරුදු ≥12 සහ ඊට වැඩි සියළුම අය හට Pfizer එන්නත ලබා දිය හැකිය.

## මෙම එන්නත ලබා ගත යුතු නැති අය කවුරුන්ද

පහත අවස්ථාවල මෙම එන්නත ලබා නොගත යුතුය:

- එන්නතේ කලින් mRNA COVID-19 මාත්‍රාවකට **ඇනෆිලැක්සිස්** (දරුණු අසාත්මිකතා ප්‍රතිචාර) ඇතිවූ අය (එනම්, Pfizer හෝ Spikevax (Moderna) එන්නත)
- පොලිඑතිලින් ගලයිකෝල් (PEG) ඇතුළු **එන්නතේ කිසියම් සංඝටකයකට නිරාවරණයවීමෙන් පසු ඇනෆිලැක්සිස් ඇතිවූ අය**
- කලින් mRNA COVID-19 එන්නත් මත්‍රාවක් **මයෝකාඩිටිස් සහ/හෝ** පෙරිකාර්ඩිටිස් හා සම්බන්ධවීම (එනම්, Pfizer හෝ Moderna එන්නත)
- පළපුරුදු එන්නත් සපයන්නෙකු හෝ වෛද්‍ය විශේෂඥයෙකු සමාලෝචනය කල පසු mRna COVID-19 එන්නතෙහි (එනම්, Pfizer හෝ Moderna) කලින් මාත්‍රාවකට පසු, කිසිදු හේතුවක් හඳුනා නොගෙන **වෙනත් කිසියම් දරුණු අහිතකර බලපෑම් ඇතිවූ අයෙක්**

## එන්නත සම්බන්ධ පූර්වාරක්ෂණ

සමහර තත්වයන් ඇති අය විසින්, එන්නත ලබා ගැනීමෙන් පසු මිනිත්තු 30 ක් නිරීක්ෂණය සඳහා රැඳී සිටීම හෝ අසාත්මිකතා විශේෂඥයෙකු හමුවීම වැනි අමතර පූර්වාරක්ෂණ ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය විය හැකිය. ඔබට පහත දේ අදාල නම්, ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන අය හට දැනුම් දෙන්න:

- කලින් ලබාදුන් mRNA COVID-19 එන්නතෙහි මාත්‍රාවකට (එනම්, Pfizer හෝ Moderna) හෝ එහි **අඩංගු දෙයකට අසාත්මික ප්‍රතිචාරයක්** ඇතිවුණි නම්
- **වෙනත් එන්නත් හෝ වෙනත් බෙහෙත්වලට ඇනෆිලැක්සිස්තත්වයක් ඇති වුණි නම්**. ඔබ ලබන කෝවිඩ්-19 එන්නතෙහි ඒ හා සමාන දේ අඩංගු වන්නේ දැයි ඔබගේ සපයන්නා හට සොයා බැලිය හැකිය
- ප්‍රතිකාර අවශ්‍ය වන නැවත නැවත ඇනෆිලැක්සිස් ඇතිවීම සමඟ ස්ථිර ලෙස ඇති මැස්ටොසයිටෝසිස්.

**ඔබට රුධිර වහනයවීමේ රෝගයක් ඇතිනම්** හෝ **රුධිරය තුනීවන බෙහෙතක් ලබා ගන්නේ නම්** (රුධිර කැටිගැසීමට එරෙහි බෙහෙත්), ඔබගේ එන්නත් සපයන්නා හට ඒ බව පවසන්න. ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා විසින් ඔබට මාංශ පේශී තුලට එන්නතක් ලබාදීම සුදුසුද යන්න සහ එන්නත ලබාදීමට සුදුසුම කාලය තීරණය කිරීමට උපකාර කල හැකිය.

## එන්නත ලබා ගැනීමට පෙර සාකච්ඡා කලයුතු විශේෂ අවස්ථානුගත කරුණු

### Pfizer සම්බන්ධයෙන් පූර්වාරක්ෂක රෝගී තත්වයන් ඇති අය

පහත කිසියම් රෝග ඉතිහාසයක් ඇති අය හට Pfizer ලබාගත හැකි වුවද, වඩාත්ම හොඳ කාලය සහ වෙනත් කිසියම් අමතර පූර්වාරක්ෂණ ලබා ගත යුතුද යන්න සම්බන්ධයෙන් සාමාන්‍ය වෛද්‍යවරයෙකු, ප්‍රතිශක්තිකරණ විශේෂඥයෙකු, හෝ හෘද රෝග විශේෂඥයෙකුගෙන් උපදෙස් ලබා ගත යුතුය:

- මෑත කාලීන (එනම් පසුගිය මාස 6 ඇතුලත) ඉන්ෆ්ලමේටරි කාඩියක් රෝගය උදා. මයෝකාඩිටිස්, පෙරිකාඩිටිස්, එන්ඩොකාර්ටඩිටිස්
- දරුණු රූමටික් උණ (එනම්, ඇක්ටිව් මයෝකාඩියල් ඉන්ෆ්ලමේෂන්) හෝ ඇකියුට් රූමටික් හෘද ආසාදනය
- ඇකියුට් ඩිකොම්පෙන්සේටඩ් හෘදයේ අසමත්වීම.

## දුර්වලවූ ප්‍රතිශක්තිකරණ පද්ධතියක් ඇති අය (ප්‍රතිශක්තිකරණය හීනවූ)

ප්‍රතිශක්තිකරණය හීනවූ අය අතර සිය ප්‍රතිශක්තිකරණ පද්ධතිය හීනවන රෝග තත්වයක් ඇති අය. සිය ප්‍රතිශක්තිකරණ පද්ධතිය හීන කරන බෙහෙත් ලබා ගන්නා අයද මේ අතර සිටී.

ප්‍රතිශක්තිකරණය හීනවූ අය විසින් කෝවිඩ්-19 එන්නත ලබාගත යුතු වට ඕස්ට්‍රේලියානු රජය විසින් තරයේ නිර්දේශ කරයි. Pfizer ජීවී එන්නතක් නොවේ. ප්‍රතිශක්තිකරණය හීනවූ අයට මෙය ආරක්ෂාකාරීවේ.

ප්‍රතිශක්තිකරණය හීනවූ අය අතර එච්.අයි.වී. සමඟ ජීවත්වන අය, කෝවිඩ්-19 හේතුවෙන් මරණය ඇතුළුව දරුණු අසනීප ඇතිවීමේ අවදානම ඇති අය සිටී.

Pfizer සම්බන්ධ චිකිත්සක අත්හදා බැලීම් කල අය අතර ප්‍රතිශක්තිය හීනවූ අය නොසිටින ලදී. නමුත් එච්.අයි.වී. තිබී ස්ථාවරවූ අය කුඩා කණ්ඩායමක් සිටින ලදී. අන් ජනගහණය සමඟ සැසඳීමේදී ප්‍රතිශක්තිකරණය හීනවූ අය අතර Pfizer ඵලදායිද යන්න අපි නොදනිමු. සාමාන්‍ය ජනගහණය හා සැසඳීමේදී ප්‍රතිශක්තිය හීනවූ අය අතර Pfizer ඵලදායී නොවිය හැක. එන්නත ලබා ගැනීමෙන් පසු ශාරීරික දුරස්ථභාවය වැනි පූර්වාරක්ෂණ ක්‍රියා මාර්ග දිගටම ගැනීම වැදගත්වේ.

## ගර්භනී, හෝ දරුවන්ට කිරි පොවන මව්වරුන්

ගර්භනී මව්වරු සහ තරුණ කාන්තාවන් හට ගර්භනී බවේ කුමන අවස්ථාවක වුවද Pfizer හෝ Moderna ලබා දිය හැකිය. ඔබ ගර්භනී වීමට උත්සාහ කරන්නේ නම් එන්නත ලබා ගැනීම ප්‍රමාද කිරීම හෝ එන්නත ලබා ගැනීමෙන් පසු ගර්භනීවීම මඟ හැරීම කල යුතු නැත.

කෝවිඩ්-19 ආසාදිත ගර්භනී කානතාවන් දරුණු ලෙස රෝගාතුර වීමේ වැඩි අවදානමක් ඇති අතර අහිතකර ලෙස ගර්භනීත්වයේ ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකිය. සත්‍ය ලෙස ලැබී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ ගර්භනී කාන්තාවන් සහ කිරි පොවන මව්වරුන් හට Pfizer ආරක්ෂාකාරී බවයි.

ඔබ දරුවන් හට කිරි පොවන්නේ නම්, Pfizer ලබාගත හැකිය. එන්නත ලබා ගැනීමෙන් පසු කිරි පෙවීම නැවැත්විය යුතු නැත.

## කෝවිඩ්-19 ඉතිහාසයක් ඇති අය

ඔබට කලින් කෝවිඩ්-19 ආසාදනයවී තිබුණි නම්, ඔබගේ ප්‍රතිශකතිකරණ සපයන්නා හට ඒ බව පවසන්න. ආසාදනය ඇති බවට සනාථවූ අය විසින් දරුණු ලෙස රෝගාතුරවීමෙන් පසු මාස හයක් යනතෙක් එන්නත ලබා ගැනීම ප්‍රමාද කල හැක්කේ ලැබී ඇති සාක්ෂි මගින් පෙනෙන ආකාරයට අතීත ආසාදනයක් මගින් නැවත ආසානය ඇතිවීමේ අවදානම අවම වශයෙන් මාස හයක්වත් යනතෙක් නොපැවතීම හේතුවෙනි. කෙසේවුවද, රෝග ලක්ෂණ සහිත ආසාදිත කාලය අවසන්වූ පසු එන්නත ලබාදීම ආරම්භ කල හැකිය. සමහර අය අතර ආසාදනයවී මාස හයකට පෙර එන්නත ලබාදිය හැකිය. ඔබගේ වෛද්‍යවරයා හෝ එන්නත ලබා දෙන අය සමඟ සාකච්ඡා කරන්න. ඔබට කෝවිඩ්-19 හේතුවෙන් දිගින් දිගටම පවතින අසනීප ඇතිනම්, ඔබට ප්‍රතිකාර කරන වෛද්‍යවරයා සමඟ එන්නත ලබා ගැනීම සඳහා හොඳම කාලය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න.

## Pfizer සහ දරුවන්

Pfizer වයස අවුරුදු 12 සහ ඊට වැඩි අයට ලබාදීම සඳහා තාවකාලික ලෙස නිර්දේශ කර ඇති අතර ඊට වඩා අඩු වයස් අයට ලබා දිය නොහැක.

# Pfizer හි ආරක්ෂාව සහතික කිරීම

එන්නත් පර්යේෂණ සඳහා වැඩිපුර මුදල් ප්‍රදාන සහ පර්යේෂණ අධ්‍යයනයන් සඳහා බොහෝ ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වූ අය සිටීම හේතුවෙන් Pfizer සහ වෙනත් කෝවිඩ්-19 එන්නත ඉතා ඉක්මණින් දියුණු කරන ලදී. 44,000 පමණ විශාල කණ්ඩායමක් සම්බන්ධවී කල විශාල සායනික අත්හදා බැලීම් මගින් සනාථවූයේ Pfizer ආරක්ෂාකාරී සහ ඵලදායී බවයි.

ප්‍රතිකාර භාණ්ඩ පරිපාලනය (Theraputic Gods dministration-TGA) මගින් ඕස්ට්‍රේලියාවේ සියළුම එන්නත් ඇගයීම සිදු කරයි. මේ මගින් එන්නතක් අනුමත කිරීම සඳහා එය ආරක්ෂාකාරී, ඵලදායී සහ ඉතා ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු බවට සහතික විය යුතුය. කෝවිඩ්-19 එන්නත් අනුමත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ විස්තරයක් TGA වෙබ් අඩවියේ ඇත.

කෝවිඩ්-19 ආරක්‍ෂාකාරීබව සම්බන්ධයෙන් කෝවිඩ්-19 ප්‍රතිශක්තිකරණ වැඩසටහන පුරාම නියාමනය කරනු ලැබේ.

කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත ලබාගත් පසු රුධිර පට්ටිකා ප්‍රමාණය අඩුවීම සමඟ රුධිරය කැටි ගැසීම ඇතුලත් විරල අතුරු ආබාධයක් වාර්තාවී ඇත. කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත නිපදවන්නේ වෙනස් ආකාරයකටය. මෙම වෛද්‍ය තත්වය Pfizer කෝවිඩ්-19 එන්නත හා සම්බන්ධකමක් ඇති බවට කිසිදු සාක්ෂි නොමැත.

සැක කරනු ලබන අතුරු ආබාධ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා හෝ වෙනත් සෞඛ්‍ය රැකවරණ වෘත්තීකයන් හට වාර්තා කල හැක. ඔවුන් විසින් ඔබ වෙනුවෙන් ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත හෝ TGA වෙත විධිමත් වාර්තාවක් යවනු ඇත.

ඔබ විසින් කෙළින්ම වාර්තා කිරීමට කැමති නම්, කෝවිඩ්-19 එන්නත සම්බන්ධ සැක කරන අතුරු ආබාධ වාර්තා කරන ආකාරය සම්බන්ධ තොරතුරු සඳහා TGA වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.